**තේවත්ත ජාතික බැසිලිකා සිද්ධස්ථානයේ ඉතිහාසය පිළිබඳ විචාරාත්මක ඇගයීමක්**

***(A CRITICAL EVALUATION ON THE HISTORY OF THE THEWATTA NATIONAL BASILICA)***

ඩබ්. එෆ්. ආර්. ප්‍රනාන්දු

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය

දෙවන ලෝක මහා යුද සමයේ දී අප මව්බිම ආක්‍රමණවලින් ආරක්ෂා වීම අරභයා දේවමාතාවන්ට ඔප්පුකරන ලද බාරයක් ලෙස 1974 දී ඉදි වූ ශ්‍රී ලංකාවේ විශාලතම බැසිලිකා සිද්ධස්ථානය වන **තේවත්ත බැසිලිකාව පිළිබඳ ඉතිහාසය** විචාරාත්මක ව අධ්‍යයනයකට ලක් කිරීම මෙම පර්යේෂණයේ අන්තර්ගතය ලෙස දැක්විය හැකිය.

උක්ත නිබන්ධ අන්තර්ගතයට අදාළ ව මෙහි ප්‍රධාන පර්යේෂණ ගැටලුව වනුයේ ජාතික බැසිලිකාව ලාංකේය කතෝලික සභා ඉතිහාසයේ ප්‍රධාන සංධිස්ථානයක් වූයේ ද යන්න පුළුල් ව විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම ය.

ඉහත ගැටලුව කේන්ද්‍ර කර ගත් මෙකී ශාස්ත්‍රීය අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු දෙකකි. එනම් බැසිලිකාව ඉදිකිරීමට පසුබිම් වූ හේතුව හා කතෝලික සභා වංශ කතාව ලක්වැසි සියල්ලන්ට පතළ කළ කිතුනුකම ජීවත් කරවීම සඳහා ශාසනයෙන් ලද දායකත්වය පිළිබඳ ව විමසීම යි.

මෙම නිබන්ධයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේදය වනුයේ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි, ඉතිහාසයට අදාළ පුද්ගලයන් සමඟ සංවාද, සාකච්ඡා පැවැත්වීම යනාදිය වේ. එසේ ම තෝරා ගත් ප්‍රධාන මාතෘකාවන්ට අදාළ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි අධ්‍යයනය කරමින් ඒවායේ කරුණු විශ්ලේෂණය කරමින් තොරතුරු රැස් කිරීම සිදු කොට ඇත.

**මූලික පද:** බැසිලිකාව, බාරය, ඉතිහාසය